**උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**තෙවන වාර පරීක්ෂණය - 2024**
**13 ශ්‍රේණිය ක්‍රිස්තියානි ධර්මය - පළමු පත්‍රය ඃ පිළිතුරු පත්‍රය**

01. (3) ජෝශප්ව ඉෂ්මායෙල්වරුන්ට විකුණූ ස්ථානය යි.
02. (4) මිස්පා
03. (2) මහා ඇලෙක්සැන්ඩර්
04. (2) රජවරුන්ගේ යුගය
05. (4) ජොෂියා රජු
06. (1) J
07. (2) E
08. (2) ආබ්‍රහම් තුමාගේ කැඳවීම හා ඔහු කැඳවීමට පිළිතුරු දීම සඳහා
09. (4) ආබ්‍රහම්ගේ හා සාරායි ගේ නම් වෙනස් කිරීම
10. (3) මට්සාහ්
11. (1) හර්මන් ගුන්කල්
12. (2) ආතර් වයිසර්
13. (3) සිග්මන් මොවින්කල්
14. (4) රාජකීය ගීත
15. (3) ආසාක්ගේ ගීතිකා
16. (1) හිතෝපදේශය හා සිරාක්
17. (5) මරණින් මතු ආත්මයක් පිළිබඳව විශ්වාස නොකිරීම
18. (3) ගලීලයේ ජුදාස්
19. (2) එසේනිවරු ය.
20. (4) මාක් හා Q වේ.
21. (3) දේශීය සභාවල පාලනය හා සංවිධානය
22. (1) ක්‍රිස්තුන් වහන්සේ මේ වචන කියා නිම වූ කල්හි
23. (5) අබ ඇටය පිළිබඳ උපමාව
24. (1) පැපියස් තුමා, ඉරනේයස් තුමා, ඔරිගන් තුමා
25. (4) අකිලා හා ප්‍රිස්කිලා විසිනි
26. (5) රොටි ගෙන "ආශීර්වාදය" පැවසීම
27. (2) පාවුලු තුමා ය
28. (4) ගීතාවලිය, යෙසායා
29. (4) ජේසුස් වහන්සේ බෞතීස්ම ස්නාපනය කිරීම
30. (3) සෝමා
31. (3) III පාවුලු සුදතුම් පියා
32. (5) බහුදේවවාදය
33. (2) පූර්ණ දිවියකට මග
34. (1) ශු. රොබට් බෙලාමියන් තුමා
35. (3) X පියුස් සුදතුම් පියා
36. (5) 1965
37. (3) 11 වන සියවස
38. (3) VIII බෙනඩික්ට් සුදතුම් පියා ය.
39. (1) ස්ලැවික් ගෝත්‍රික ජනතාවට
40. (2) අයර්ලන්තයේ ය
41. (1) සුරදූතික සොයුරියන්ගේ පැවිදි නිකාය
42. (4) ජයවීර බණ්ඩාර
43. (1) යාපනය ශාන්ත මාර්ටින් දෙව්සත්හල
44. (3) මහනුවර
45. (4) A,B,D,E
46. (4) ශු.ජොහාන් තුමා ය
47. (5) හෘද සාක්ෂිය මතය
48. (1) යහපත් සමරිතානුවරයාගේ උපමාව
49. (4) ගැලවීමේ හමුදාව
50. (1) 1 කොරින්ති හසුන

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත**
**තෙවන වාර පරීක්ෂණය-2024**
**ක්‍රිස්තියානි ධර්මය-දෙවන ප්‍රශ්න පත්‍රය ඃ 13 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**

01. 1. ✶සමිඳාණන් වහන්සේ මෙසේ වදාරණ සේක.
✶සමිඳාණන් වහන්සේගේ පණිවුඩය …………..වෙතට පැමිණියේය.
✶මෙසේ පවසන්නේ සමිඳාණන් වහන්සේ වන මමය.

II. ✶අසිරිමත් උපදේශකයාණෝ ඃ
දෙවියන් වහන්සේ වෙතින් උපදෙස් ලබන මෙතුමා මිනිස් ප්‍රඥාව මත පමණක් විශ්වාසය නොතබන බැවින්, මිනිසාට මග පෙන්වීමක් කළ හැකි දේව ප්‍රඥාවෙන් පූර්ණ උත්තමයෙකි.
✶ප්‍රතාපවත් දෙවිතුමාණෝය ඃ
පුරාණයේ රජවරුන් සතු පරමාධිපත්‍ය පෙන්වීමට මෙම නාමයෙන් ආමන්ත්‍රණය කරනු ලැබීය.
✶සදාතන පියාණෝය
✶සාමයේ කුමාරයාණෝ ය

III. ✶**ප්‍රඥාව (හොක්මා)** යුක්ති සහගතව හා නිවැරදිව ජීවිතයට මුහුණ දීමේ හැකියාව
✶**නුවණ** දේව කැමැත්ත තෝරා බේරා ගැනීමේ හැකියාව
✶**අනුශාසන බුද්ධිය** තව කෙනකුට තෝරා බේරා ගැනීමේ හැකියාව

IV. ✶ඉහළ සමාජ පංතිය නිසා බිහිවූ දුගී දුප්පත් සූරා කෑමට ලක්වූ පිරිස වෙනුවෙන් මැදිහත්වීම
✶ඉහළ තනතුරු දරන අයගේ සුඛෝපභෝගී ජීවිත පිළිබඳව අවදි කරවීමෙන් දිළින්දන්ට සහනය දීම.
✶ආමොස් මෙන් අසාධාරණත්වය දැඩි ලෙස හෙළා දකිමින් දිළිඳු ජීවිත නඟා සිටුවීම.
✶සිය රැකියා කටයුතුවලදී ඊශ්‍රායෙල් ජනතාව එහි ශුද්ධත්වය කෙලෙසා දමා ඇතැයි ආමොස් දිවැසිවරයා පැවසූ ආකාරයෙන් වර්තමාන සමාජය තුළ සිය රැකියාවල ගෞරවාන්විතව නොයෙදෙන අයට ඒ පිළිබඳ දැනුවත් කිරීම.

02) 1. පරිසිවරු /විනයධරයන් /සද්දුසිවරු/සෙලට්වරු
II. ✶පෙළපත දැක්වීම මඟින් ක්‍රිස්තුන් වහන්සේ ආබ්‍රහම්ගේ හා දාවිත්ගේ පුත්‍රයා ලෙස ඉදිරිපත් කිරීම.
✶ක්‍රිස්තුන් වහන්සේ පැරණි ගිවිසුමේ පූර්ණත්වය ලෙස ඉදිරිපත් කිරීම.
✶ක්‍රිස්තුන් වහන්සේ ජුදෙව් ව්‍යවස්ථාවට නව මග පෙන්වීමක් ලබා දෙන බව දැක්වීම.

III. ✯ **පළමු අවධිය (ක්‍රි.ව. 0-33)**
ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය හා ඊට අදාළ සිදුවීම් ද උන්වහන්සේ කළ කී දෑ හා උන්වහන්සේගේ උපතේ සිට මුළු මහත් දූත සේවාව පිළිබඳවත් එහිදී උන්වහන්සේ කළ කී දෑ පිළිබඳවත් මේ අදියරට අයත් වේ.
✯ **දෙවන අවධිය (ක්‍රි.ව. 33-50)**
ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානය හා ස්වර්ගාරෝහණයෙන් පසු ශුද්ධාත්ම දානය ලැබූ ශ්‍රාවකයින් ඇතුළු මුල් කිතුනුවන්ගේ සාක්ෂි හා වාචික තොරතුරු මෙම අදියරට අයත්ය.
✯ **තෙවන අවධිය (ක්‍රි.ව. 70-100)**
ශුභාරංචි කතුවරුන්ගේ පරමාර්ථ, දර්ශන හා දැක්මට අනුගතව ශුභාරංචි වාචික සම්ප්‍රදායය ලේඛනගතවීම තෙවන අදියර වේ.

IV. **ලූක්තුමාගේ සුබාරංචියේ පරමාර්ථ :**
ක්‍රිස්තුන් වහන්සේ මානව දයාවෙන් හා කරුණාවෙන් පිරි උතුම් මිනිසත් බව ගරු කරන විශ්වීය ගැලවුම්කරු ලෙස හඳුන්වා දීම.

⭐ **පරමාර්ථය ඉටුකර ගැනීමට ඔබට කළ හැකි දේ :**

●ජේසුස් වහන්සේ එදා ජුදා සමාජයේ ප්‍රතික්ෂේපිත ජන කොටස්වලට දැක්වූ සානුකම්පිත බව වර්තමානයේ පීඩිතවූවන්ට දක්වීම උදා:- කාන්තාවන්/දරුවන්/ අයකැමියන්

●ක්‍රිස්තුන් වහන්සේ විශ්වීය ගැලවුම්කාරයාණන් බව අත්දැකීමට ජනතාව මනස්ථාපනය සඳහා යොමු කිරීම. මනස්ථාපනයෙන් ගැලවීම උදාවන බව පෙන්වාදීම.

●විශ්වීය ගැලවුම්කරුවාණන්ගේ සුවය දානය, වර්තමානයේ ද අත්දැකීමට අවශ්‍යවන ඇදහිල්ල කරා දේව ජනතාව යොමු කරවීම.

03. i). නිසියානු ජගත් මන්ත්‍රණ සභාව /දෙවන වතිකානු මන්ත්‍රණ සභාව

ii). එපීස ජගත් මන්ත්‍රණ සභාව

- මරියතුමියගේ කුසයෙහි මනු කයගෙන පිළිසිඳ ගත්තේ දේව පුත්‍රයා වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ නිසා එතුමියට දේව මෑණියන් (Theotokos) යන ගෞරව නාමය දිය හැකිය.

iii). ● ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේ සමඟ එකම භවත්වය ඇතිව වැඩ සිටින සේක. ජනිත වූ නමුත් මවනු නොලැබූ සේක

●ක්‍රිස්තුන් වහන්සේ එක් පුද්ගලයෙකි. උන්වහන්සේ තුළ දේවත්වය හා මනුෂ්‍යත්වය ඒකාබද්ධව පවති.

●ක්‍රිස්තුන් වහන්සේ සැබෑ දෙවියන් ද සැබෑ මනුෂ්‍යයා ද වන සේක.

iv) ●දේව විශ්වාසය ආරක්ෂා කරගනු සඳහා ගැඹුරු ඇදහිල්ල පතා දෙවියන් වහන්සේට දෛනිකව යාච්ඤා කිරීම.

●දේව විශ්වාසය තුළ ජීවිතය ජයගත් බයිබලීය ජීවිත නිතර කියවමින් ඒ තුළ දේව විශ්වාසය වර්ධනය කරගැනීම.

●දේව විශ්වාසය පලුදුවීමට තුඩු දෙන අශුද්ධාත්මික බලවේගය ජයගැනීමට නිරන්තරයෙන් දේව වචනයේ ශක්තිය පැතීම.
උදා:- ජේසුස් වහන්සේ තුන් ආකාර පරීක්ෂා ජයගැනීම.

●දේව විශ්වාසය ආරක්ෂා කරගැනීමට අප දරන උත්සාහය මෙන්ම එසේ කිරීමට නොහැකි අයට ඒ සඳහා සහයෝගය දැක්වීම සහ මග පෙන්වීම.

04) i. නික්මයාමේ සිද්ධිය මැවීම පිළිබඳ දෙවන කතාවට පසුබිමක් සපයයි. එබැවින් මැවීමේ දෙවන කතාව නික්මයාම සිද්ධිය අතර දැඩි සබඳතාවයක් දක්නට ලැබේ. නික්මයාමේ දී,

- සමිඳාණන් වහන්සේ ඉශ්රායෙල්වරුන් කාන්තාරයෙන් ගත් සේක.
- උන් වහන්සේ ඔවුන් සශ්‍රීක රටකට ගෙනගිය සේක.
- එම ගමනේ දී උන්වහන්සේ ඔවුන්ට දස පනත දුන් සේක.
- ඔවුහු එයට අවනත නොවී එම නියමයන් කඩ කළෝ ය.
- එම නිසා ඔවුන්ට දඬුවම් ලැබිණි.

මෙම රටාව මැවීම පිළිබඳ දෙවන කථාවේ ද දක්නට ලැබේ.

- ජලය හීන කාන්තාර ප්‍රදේශයක මිනිසා මවනු ලැබුවද (උත්.2:4ආ-5)
- එම කාන්තාර ප්‍රදේශයෙන් මිනිසා ගෙන ක්ෂේම භූමියක් වැනි ඒදන් උයන මවා දෙවියන් වහන්සේ මිනිසා ඒදන් උයනෙහි පදිංචි කරවූ සේක. (2:8-9)
- එහි ජීවත් විය යුතු ආකාරය පනතකින් ඉදිරිපත් කළ සේක (2:17)
- මිනිසා එම පනත කඩ කළේ ය. (3:6)
- එම නිසා ඔහුට දඬුවම් හිමි වේ. (3:14-24)

ii)

- ''පාපය යනු දෙවියන් වහන්සේ සතු දේ මිනිසා සතු කරගැනීමට දරන ප්‍රයත්නයකි'' යන කියමන සරලව පිළිතුරට පිවිසුමක් ලෙස විග්‍රහ කර තිබීම
- බයිබලය තුළින් දෙවියන් වහන්සේ සතු කුමන දෑ මිනිසා සතු කරගැනීමට උත්සාහ දරා තිබේදැයි හඳුනාගැනීම සහ එය පැහැදිලි කිරීම.

- පාපය නිසා විනාශ වන ලොව තුළ කිතුනුවකු ලෙස පාපයට ලොල් වූ අයට දෙවියන් වහන්සේගෙන් ලැබෙන සමාව දීම විස්තර කිරීම
  උදා :- කායින් ආබෙල් කතා පුවත තුළින් පාපය තුළින් බැහැරවන පවිකාරයට පවා දෙවියන් වහන්සේ දයාව-කරුණාව දක්වන බව පවිකාරයාට පැහැදිලි කිරීම.
- පාපයට පෙළඹවීමට ඇති අවස්ථා හඳුනාගැනීමට මහන්සි ගැනීම, ඒවා ජයගැනීමට ශුද්ධාත්ම මග පෙන්වීමට යොමු කිරීම.
- පාඑකරයේ අත්දැකීම තුළ පාපය කොපමණ ප්‍රබල වුවද දෙවියන් වහන්සේ තුළ පැවතීමෙන් ජේසුස් වහන්සේ පාපය ජයගැනීම හා ඒ තුළ අපට ලැබෙන මග පෙන්වීම පැහැදිලි කිරීම.
- වරෙක සාවුල් නම්වු ශුද්ධවු පාවුලු පාපයට යොමුවී සිටියේය. එහෙත් එක් මොහොතකදී ඔහුට උත්ථානයේ ස්වාමීන් වහන්සේ කථා කළ සේක. ඒ තුළින් පාපයෙන් ජයගැනීමට ඔහුට හැකිවිය. අපිද පාපය ජයගැනීමට ස්වාමීන් වහන්සේගේ හඬට සවන්දීම

05) i. පාවුලුතුමාගේ ලිපිවල පොදු වශයෙන් ග්‍රීක රෝම සාහිත්‍යමය අංග ඇසුරෙන් කරුණු පැහැදිලි කිරිමේ ක්‍රමවේදයක් අනුගමනය කර ඇති බව පැහැදිලි ව පෙනේ.

1. සන්දේශයේ ආමන්ත්‍රණය-යවන්නා සහ ලබන්නාගේ නම් සඳහන් කරයි.
2. කෙටි ආචාරයක් හෝ සුබ පැතීමක්-ලබන්නාගේ පරිසරයට යෝග්‍ය ආචාරයක් හෝ සුබපැතීමක් සඳහන් වේ.
3. තුති දීමක් හෝ යාච්ඤාවක්-සන්දේශය ලිවීමේ අරමුණ සඳහන් කර ඒ පිළිබඳව තුති පිදීමට හෝ යැදුමකින් දක්වීමට හෝ උත්සුක වී ඇත.
4. පණිවිඩය-ධාර්මික ඉගැන්වීම හා අනුශාසනා ලෙස කොටස් දෙකකින් ඉදිරිපත් කරයි.
5. අවසානය හා සුබ පැතුම, ආශීර්වාද යැදුම මෙයින් බොහෝ විට ඉදිරිපත් කරනුයේ පෞද්ගලික තොරතුරු හා විනය සම්බන්ධ සරල, එහෙත් විශේෂ අනුශාසනාවකි. අවසාන ප්‍රාර්ථනයෙන් විශේෂ ආශීර්වාදයක් පිරිනමයි.

ii.
- කිතුනු පවුල ශුද්ධ වූ සභාවේ ජීවනාලියයි. කිතුනු පවුල් රාශියක් එක්ව ගොඩ නැගුණු දෙවියන් වහන්සේගේ විශේෂ පවුල ශුද්ධ වූ සභාවයි. එම නිසා පවුල් ජීවිතය ද ශුද්ධ වූ සභාවේ ජීවිතය ද අතර කිට්ටු සබඳතාවයක් ඇත.
- මේ ප්‍රශ්නයට පිළිතුරු ගැලපීමේදී අදාල බයිබල් පාඨය සමග පිළිතුර ගළපා තිබිය යුතුය.
- ගෘහස්ථ පාලනයේදී  භාර්යාව ස්වාමි පුරුෂයාට කීකරු විය යුතුය. ස්වාමියා සිය භාර්යාව වෙත ක්‍රියා කිරීමේදි කරුණාවෙන් කටයුතු කළ යුතුය.
- ශු. පාවුලු තුමා ස්වාමිපුරුෂයා හා භාර්යාව අතර තිබිය යුතු සම්බන්ධතාවය ක්‍රිස්තුන් වහන්සේ හා සභාව අතර ඇති සම්බන්ධතාවයට සමාන කරයි. ඒ සම්බන්ධතාව පවුල් දිවිය ශක්තිමත් කරගැනීමට යොදාගත යුතුය.
- ක්‍රිස්තුන් වහන්සේ ශුද්ධවු සභාවට ප්‍රේම කළාක් මෙන් ස්වාමි පුරුෂයා තම භාර්යාවට ප්‍රේම කළ යුතුය. වර්තමානයේදී සභා සාමාජිකයන් වන අපගේ ප්‍රේමය එකිනෙකාට දැනෙන ප්‍රේමයක් බවට පත්කර ගැනීමට උත්සාහ ගත යුතුය.

06) i. මුලින්ම පිළිතුරට ලන්දේසි පීඩන සමය තුළ සේවය කළ  ඔරතෝරියානු නිකායික පියවරුන් කවුරුන්ද යන වග  ලියා දක්වා තිබීම
උදා ඃ ජුසේවාස් පියතුමා/ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා

- එදා ඔරතෝරියානු නිකායික පියතුමන්ලා දේශපාලන සම්බන්ධයක් හෝ රාජ්‍ය අනුග්‍රහයක් හෝ නොමැතිව ධර්මදූත ප්‍රචාරය සාර්ථකව කළ බව අපි දනිමු. එලෙසින්ම වර්තමාන ධර්මදූතවරුන් ද දේශපාලන සම්බන්ධතාවලින් බැහැරව තම ධර්මදූතික කාර්යය කරගෙන යාමට මහන්සි ගත යුතුය.
- ඔරතෝරියානු නිකායික පියවරු තම ධර්මදූත කටයුතු පහසු කරගැනීම සඳහා ගිහි දායකත්වය යොදා ගත්හ. එලෙසම පොදු පූජකවර ගිහියා සතු දිවැසි -පූජක - එඬේරික යන ත්‍රිවිධ කාර්යය ක්‍රියාත්මක කිරීමට ගිහියන්ව සම්බන්ධ කරගැනීම වර්තමාන ධර්මදූතයින්ගේ වගකීමකි.
- ජුසේවාස් පියතුමා, ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා වැනි ඔරතෝරියානු නිකායික ධර්මදූතවරු ලන්දේසී පීඩන සමයේදී වඩා හොඳින් ධර්මදානයේ යෙදෙන්නට සිංහල හා දෙමළ යන භාෂා දෙකම ඉගෙන ගත්හ. අද ද ධර්මදූතවරු වඩා හොඳින් ධර්මදානයේ යෙදෙන්නට තම මව් භාෂාවට අමතරව වෙනත් භාෂා ඉගෙනීම කෙරෙහි ද අවධානය යොමු කළ යුතුය.

වර්තමාන ධර්මදූතවරුද දේවධර්ම ශාස්ත්‍රීය කරුණු ඉතා සරල ලෙස පැහැදිලි කිරීමට විවිධ ක්‍රමෝපායන් පිළිබඳව තම අවධානය යොමු කළ යුතුය.

07. (1)
- ලෝක සභා මන්ත්‍රණ සභාව ( WCC ) විසින් 1982 ජනවාරි 15 දින පීරූ රාජ්‍යයේ ලීමා නුවර දී ප්‍රකාශයට පත් කරන ලද ලියවිල්ලකි.
- ලීමා ලේඛනය ලෙස ද හඳුන්වනු ලබන මෙම ලියවිල්ල සභා ජීවිතය හා විශ්වාසය සම්බන්ධ ව එකඟ වීම් මෙන් ම වෙනස්කම් ද සැලකිල්ලට ගනිමින් සකස් කරන ලද්දකි.
- ජගත් ක්‍රිස්තියානි ලේඛනයක් ලෙස පිළිගැනීමට ද තොරතුරු ලබා ගැනීමට ද අදටත් භාවිත කෙරේ.
- BEM යන කෙටි නාමයෙන් හඳුන්වනු ලබන මෙම ලියවිල්ලෙහි බව්තීස්මය, දිව්‍ය යාගය හා දේවගැති ධූරය පිළිබඳව විස්තර වනුයේ ඒ සඳහා ගොඩ නැඟෙන එකමුතුකම පෙන්වාදීමටය. මෙම ලේඛනයේ ප්‍රධාන පද තුනක් විස්තර කෙරේ.

**බව්තීස්මය ඃ**

✶ බව්තීස්මය, ක්‍රිස්තුන් වහන්සේ තුළ නව ජීවිතයකට පිවිසීමකි

✶ උන් වහන්සේගේ මරණයට හා උත්ථානයට පංගුකාර වීම මඟින් නව ජීවිතයකට අඩිතාලම දැමීමක් මෙහි දී සිදු වේ.

**දිව්‍ය යාගය ඃ**

✶ ස්තුති කිරීමක්, සිහි කිරීමක්, සහභාගීකමක් හෝ දිව්‍ය භෝජනයක් හෝ ලෙස දක්වති.

✶ ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත පරිත්‍යාගය මඟින් හෙළි කරන සාමාජීය හා මානුෂික හැඟීම දිව්‍ය යාගයේදී ඉස්මතු වේ.

**දේවගැති ධූරය ඃ**

✶ මෙමගින් සභාවේ අපෝස්තලිකත්වය විදහාපායි.

✶ සේවාව සඳහා දෙනු ලබන බලයකි.

- රදගුරු භූමිකාව ප්‍රදේශීය සභාවල ඉගැන්වීමට නායකත්වයට මෙන්ම වන්දි ගෙවීමට හා පාලනයට ඉවහල් වන බව ලීමා ලේඛනය දක්වයි.

(II)
✶ ස්වභාව සෞන්දර්ය විනාශවීම වැළැක්වීම සඳහා කටයුතු කිරීම.

✶ පරිසරය දූෂණය වීමේ අවස්ථා මග හැර එය සුරැකීමට හා ආරක්ෂා කිරීමට අවැසි ක්‍රියා මාර්ග ගැනීම.

✶ ස්වභාව ධර්මය ආරක්ෂා කරගනු වස් ගස්වැල් වැවීම.

08.(i)
✶ කිතුනුවන්ට විමුක්තිය අයත් වන්නේ ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි දක්වන ඇදහිල්ලෙන් පමණි.

✶ ක්‍රිස්තුන් වහන්සේ විසින් ම ස්ථාපිත කරන ලද ප්‍රසාද නිධාන දෙකකි.
(ප්‍රසාද ස්නාපනය හා දිව්‍ය සත්ප්‍රසාදය)

✶ ක්‍රිස්තුන් වහන්සේට හැර කිසිවකුට වහල් නොවිය යුතු ය.

✶ කිතුනු ජීවිතයේ කේන්ද්‍රස්ථානය දිව්‍යමය ඉගැන්වීම් සහිත ශුද්ධ බයිබලය යි.

✶ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයකටම පූජකවරය සඳහා කැඳවීම ලැබිය හැකි අතර දේවගැතිවරුනට විවාහවීමේ අයිතිය ඇත.

(II)
✶ ශුද්ධ බයිබලය හා ජීවන සභා සම්ප්‍රදායය යන දෙක ම ධාර්මික සත්‍යතාවන්හි උල්පත වන බව, එසේ නොපිළිගන්නා පිරිස්වලට විශේෂයෙන්ම මූලධර්මවාදී සභාවලට ඒත්තු ගැන්වීම.

✶ දේව ප්‍රසාද නිධාන හත ම ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කරනු ලැබූ බව පිළිගන්නා ක්‍රිස්තු සභා අඩුය. ඒ අයට මේ බව ඒත්තු ගැන්විය යුතුය. එසේම කතෝලික සභාවේ බොහෝ පිරිස් ද දේව ප්‍රසාද නිධාන හත පිළිබඳව ගැඹුරින් නොසිතා ක්‍රියා කරන බවක් දකින්නට ලැබේ. එසේම දේව ප්‍රසාද නිධානවලින් ලැබෙන වරප්‍රසාද ගැන ගැඹුරු අවබෝධයක් විටෙක කතෝලිකයාට නැත. එබැවින්, ඒ පිළිබඳව වර්තමාන සභාව ද සිහි කල්පනාවෙන් ක්‍රියා කළ යුතුය.

✶ මේ ප්‍රශ්නයට පිළිතුරු ගොනු කිරීමේදී ත්‍රිදෙන්තීනු සභා තීරණ සහ එමගින් ඉදිරිපත් කළ නවෝදයේ ව්‍යාපෘති සැලකිල්ලට ගනිමින් පිළිතුර ගොනු කර තිබිය යුතුය.

**2024-10-19**